# ලක්දිව නැගෙනහිර මුහුදේ ගිලුණු නෞකා අධ්‍යයනය හා සංචාරක කර්මාන්තය

එම්.ඩබ්.අයි.කේ දේශප්‍රිය

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

isakakalpani678@gmail.com

ප්‍රමුඛ පද: නෞකා, නැගෙනහිර මුහුද, සංරක්ෂණය, සංචාරක

## හැඳින්වීම

දියබත් වූ නෞකාවක් යනු විනාශ වී යන්නා වූ නෞකාවක කොටස් අවශේෂයන් වේ. මෙම අවශේෂයන් ජලාශ්‍රිතව මෙන්ම ගොඩබිමේ තැම්පත් වී තිබිය හැකිය. යුනෙස්කෝ සංවිධානය විසින් ඇස්තමේන්තු කර ඇති පරිදි මුහුදු පතුලේ දැනට තැම්පත්ව ඇති නෞකා ප්‍රමාණය මිලියන 03 ඉක්මවයි. බහුල වශයෙන්ම මුහුදු පුරාවිද්‍යාඥයින්ගේ අවධානයට ලක්වී තිබෙන දියබත් වූ නෞකා වර්ග කිහිපයකි.

- ඓතිහාසික නෞකා
- නිධන් වස්තු ප්‍රවාහනයේ යෙදුණු නෞකා
- සමකාලීනව නෞකා

මෙසේ මුහුදු බත් වූ නෞකා සංරක්ෂණය කර සංචාරකයන්ගේ ඉහළ ආකර්ෂණයක් ලබා තිබෙන රටවල් ගණනාවකි. එම නෞකා මගින් සැලකිය යුතු ආදායමක් එම රටවලට ලැබේ. එසේම ලෝකයේ බොහෝ රටවල් කරා මිනිසා සංචාරයේ යෙදුණු අතර මූලාශ්‍ර සාධකවලට අනුව ශ්‍රී ලංකාවද ලොව ලොහෝ රටවල් සමඟ විවිධාකර වූ වාණිජ සබඳතා පවත්වා ඇත. එසේම ශ්‍රී ලංකාවට ඈත අතීතයේ සිට නෞකා පැමිණීමට හේතු රාශියක් බලපා ඇත.

ශ්‍රී ලංකාවට ඈත අතීතයේ සිට නෞකා පැමිණීමට හේතු සාධක වූ කරුණු අතර

- ❖ ශ්‍රී ලංකාවේ පිහිටීම
- ❖ සේද මාවතේ ප්‍රධාන සංදිස්ථානයක් වීම
- ❖ ඉන්දියාවට ආසන්න ව පිහිටීම
- ❖ ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම
- ❖ ශ්‍රී ලංකාව වටා මුහුදු තීරයේ ඉතා වැදගත් දියවැල් පිහිටා තිබීම
- ❖ ඊසානදිග හා නිරිතදිග මෝසම් පැවතීම
- ❖ දූපතක් නිසා විශාල වෙරළ කලාපයක් ශ්‍රී ලංකාවට හිමිවීම
- ❖ අභ්‍යන්තර ජල මාර්ග විශාල ලෙස ශ්‍රී ලංකාවේ පිහිටීම නිසා ඒවා ඔස්සේ රට තුළට නෞකාවලට යාමට හැකිවීම
- ❖ වෙළඳ මාර්ග ආශ්‍රිත ව ශ්‍රී ලංකාව පිහිටීම
- ❖ වෙළඳ මාර්ගයේ පිහිටීම නිසා ශ්‍රී ලංකාව නැවතුම්පලක් වීම හා ඊට අවශ්‍ය පහසුකම් සැපයිය හැකි වීම යන කරුණු වේ.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණය සිදු කිරීම සඳහා මූලික වශයෙන් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය ලෙස සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය, ක්ෂේත්‍ර අධ්‍යනය, අන්තර්ජාල භාවිතය, සම්මුඛ සාකච්ඡා ආදී ක්‍රමවේදයන් භාවිත කරන ලදි. එසේ ම දත්ත විශ්ලේෂණය කිරීම සඳහා දත්ත

වගු භාවිතයෙන් ලක්දිව නැගෙනහිර මුහුදේ ගිලුණු නෞකා අධ්‍යයනය කිරීම ඔස්සේ දත්ත ගොනුගත කරන ලදි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

පෙර අපරදිග අන්තර්ජාතික වෙළඳාමේදී ශ්‍රී ලංකාව භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථානයක් ලෙසට ද කටයුතු කර ඇත. එසේම ශ්‍රී ලංකාවේ වරායන් හා තොටුපලවල් අතීතයේ අන්තර්ජාතික වෙළඳ කටයුතුවලට සම්බන්ධ ව පැවතිබව පුරාවිද්‍යා සාධක තුළින් අනාවරණය වී ඇත.ශ්‍රී ලංකාව වටා ස්වභාවික වරායන් රාශියක් පිහිටීම නිසා විදේශ සබඳතා ඇතිවීමට හේතු වී තිබේ. උතුරින් මහාතිත්ථ සහ දඹකොළපටුන ද නැගෙනහිරින් ගෝකණ්ණ, දකුණින් ගාල්ල හා ගොඩවාය දැක්විය හැකිය. විවිධ කටයුතුවලට පැමිණි නෞකා ශ්‍රී ලංකාව අවට සාගර කලාපයේගිලී ඇති අතර දශක තුනක පමණ කාලයක් තිබූ යුධ වාතාවරණයත් සමඟ මෙරට ගිලී තිබූ නෞකා ගවේශණයේ යම් පසුබෑමක් දක්නට තිබිණි. නමුත් එම සමයේ බස්නාහිර හා දකුණු පලාත්වල තරමක් දුරට ගවේශණ කටයුතු සිදු විය. නැගෙනහිර හා උතුරු ප්‍රදේශවල 2009 යුධ කටයුතු අවසන් වීමත් සමඟ එම ප්‍රදේශවලත් නෞකා හා වෙනත් පුරාවස්තුන් සෙවීමේ වර්ධනයක් දැකගත හැකි විය. මෙහි දී නැගෙනහිර මුහුදු තීරයේ (ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර) පමණක් ගිලුණු **නෞකා 21** කට අධික ප්‍රමාණයක් වාර්තා විය. මෙම ස්ථාන සංරක්ෂණය හා සංවර්ධනය කර සංචාරක කර්මාන්තයට යොදාගැනීම තත්කාලීන අවශ්‍යතාවයක් ලෙස සැලකිය හැකිය. එමගින් රටේ ආර්ථිකයට යම් තරමක් දායක කර ගැනීමට නැගෙනහිර ප්‍රදේශය ආශ්‍රිත ව ඇති මෙවැනි මුහුදුබත් වූ නෞකා භාවිතයට ගත හැකි ය.

නැගෙනහිර ප්‍රදේශය තෝරාගැනීමට හේතු වූයේ යුධ කටයුතු අවසන් වීමත් සමඟ සංචාරකයන්ටඑම ප්‍රදේශය විවෘත වීමත් සමඟ අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා ය. වර්තමානය වන විට නැගෙනහිර ප්‍රදේශයේ ගිලුණු නෞකා පිළිබඳව පර්යෙෂණ ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා ඒකකය විසින් සිදු කරයි. 2013, 2014, 2016 වර්ෂවල පර්යේෂණ කරමෙ සම්බන්ධවතොරතුරු එක්රැස් කර තිබේ.

මුහුදු පුරාවිද්‍යාව යනු නව පුරාවිද්‍යාවේ විෂය ක්ෂේත්‍රයක් වන අතර මෙය ජනතාවට ඉතාමත් ආකර්ශනීය වේ. ලෝකයේ රටවල් ගණනාවක ගිලුණු නෞකා සංරක්ෂණය කර සංචාරක ආකර්ශණයක් ලබාගන්නා රටවල් බොහෝය.විශේෂයෙන් ලෝකයේ රටවල් ගණනාවක කිමිදුම් කටයුතු සංචාරක කර්මාන්තය සඳහා යොදා ගනී.සංචාරක කර්මාන්තයේ දීඔවුන් සංචාරකයා ගමන් කිරීමට බලාපොරොත්තු වන නෞකාවේ සැලැස්මක් පෙන්වා එහි ගමන් මාර්ගය ඓතිහාසික පසුබිම විස්තර කර සංචාරකයන් මෙවැනි සංචාරක කර්මාන්තයට යොමු කළ හැකි ය. ඊට අමතරව විශේෂයෙන් ගිලුණු නෞකා නැරඹීම සඳහා මෙන් ම කොරල් පර හා මාළු නැරඹීමට dive tourismමේ පළාත්වල ද භාවිත කළ හැකි ය. ඒ සඳහා උදාහරණ ලෙස

- හික්කඩුවේ ගිලී ඇති කොන්ච් නෞකාව
- ගාල්ලේ රැන්ගුන් නෞකාව
- අර්ලොෆ් සාෆ් බැරීන් නෞකාව
- පාසිකුඩා බ්‍රිටිස් සාජන් නෞකාව
- ලෙඩි මැකලම් නෞකාව
- හර්මිස් නෞකාව
- පාසිකුඩා නෞකා සංචාරක කර්මාන්තය සංවර්ධනය භාවිත කළ හැකි ය.

ශ්‍රී ලංකාවට සුවිශේෂී සම්පතක් වූ මෙම සම්පත තිබුණ ද එම ගිලුණු නෞකා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට යොදා ගන්නේ නම් නැගෙනහිර පළාතේ ආදායම් තත්ත්වය ද සංවර්ධනය කිරීමට හැකියාව තිබේ. මේ සඳහා ශ්‍රී ලංකාවේ රජයද ප්‍රතිපත්තිමය වශයෙන් මේ සම්බන්ධව තීරණය කර ගිලුණු නෞකා ආශ්‍රිත සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යොමු විය යුතු ය.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර මුහුදේ ගිලිගිය නෞකාවල ඇති යකඩ හා වෙනත් ලෝහමය කොටස් ජාවාරම්කරුවන් මේ වන විට විනාශ කරනු ලැබේ. එය රටේ ආර්ථිකයට දැඩි බලපෑමක් වන කරුණක් බව පෙන්වාදිය හැකිය.

කාලාන්තරයක් මුහුදු පතුලේ සැඟව ඇති මෙම නෞකාවල අනන්‍යතාව සොයා බැලීම ඉතාම අපහසුය. විශේෂයෙන් නෞකා විනාශ වී ඇති නිසා එහි ඉතිහාසය සෙවීම දුෂ්කරය. (නැවේ නම, පැමිණීමට හේතුව, අයත්වන වර්ෂය, ගිලුණු වර්ෂය)සොයා ගැනීම අපහසු ය. ශ්‍රී ලංකාවේ නැගෙනහිර මුහුදේ සුවිශාල නෞකා රැසක් ගිලී තිබෙන අතර ඒවා දැවයෙන් මෙන්ම යකඩ භාවිතයෙන් නිර්මාණය කර ඇත. එසේම බොහෝ නෞකා ප්‍රමාණයක් වාෂ්ප බලයෙන් ක්‍රියාත්මක වන නෞකා වේ. ලන්දේසි හා ඉංග්‍රීසි පාලන සමයට අයත් මෙම නෞකාවල ඉතා වටිනා ඓතිහාසික පසුබිමක් පවතින අතර වර්තමානයේ අලංකාර කොරල් මාළු ආදිය විශාල වශයෙන් නෞකා ආශ්‍රිතව පවතී. නමුත් එම නෞකා සංචාරක කර්මාන්තයට යොදා නොගන්නා බවක් නොපෙනෙන අතර ඒ සඳහා යම් සංරක්ෂණ ක්‍රමවේදයක් යොදා සංචාරක කර්මාන්තයට නෞකා යොදාගැනීමෙන් රටේ ආර්ථිකයේවර්ධනයට භාවිත කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

ගුණසේකර, සමන් පුෂ්පා. (සංස්). (2015)*සාගර විද්‍යාව*.කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

*නැගෙනහිර මුහුදු පුරාවිද්‍යා ගවේශන වාර්තාව*. (2016) ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකය.

ද සිල්වා, ලයනල්(සංස්.). (2004)*මල්පියලි සිතියම් පොත*.කොළඹ: මල්පියලි ප්‍රකාශකයෝ.